# අ.පො.ස උසස් පෙළ



# ගිණුම්කරණය




## ඒකකය 01

## ගිණුම්කරණය හා එහි අවශ්‍යතාව

## ගිණුම්කරණය හා එහි අවශ්‍යතාව

### 1.1.1 ගිණුම්කරණය හැඳින්වීම

- ඇමරිකානු ගිණුම්කරණ සංගමය හා ඇමරිකානු පොදු සහතික ලත් ගණකාධිකරණ ආයතනය ගිණුම්කරණය නිර්වනය කර ඇති ආකාරයන් දක්වන්න.

✓ පිළිතුර

ඇමරිකානු ගිණුම්කරණ සංගමය

"තොරතුරු ප්‍රයෝජනයට ගන්නා පාර්ශවවලට විනිශ්චයක් කිරීමටත්, තීරණගැනීමටත් හැකිවන අයුරින් ආර්ථික තොරතුරු හඳුනාගැනීමේ, මැනීමේ සහ සන්නිවේදනය කිරීමේ ක්‍රියාවලිය ගිණුම්කරණයයි."

ඇමරිකානු පොදු සහතික ලත් ගණකාධිකාරින්ගේ ආයතනය

"යටත් පිරිසෙයින් අර්ධ වශයෙන්වත් මූල්‍යස්වරූපයක් ගන්නා ගනුදෙනු හා සිද්ධි සුවිශේෂී ආකාරයට මුදල් මාධ්‍ය උපයෝගී කරගෙන සටහන් කිරීමේ, වර්ග කිරීමේ සාරාංශ කිරීමේ සහ ඒ ක්‍රියාදාමයේ ප්‍රත්ඵලය විවරණය කිරීමේ කලාව ගිණුම්කරණයයි.

- ඉදිරිපත්කර ඇති නිර්වචන ඇසුරින් ගිණුම්කරණය පිළිබඳව පොදු නිර්වචනයක් ගොඩනගන්න.

✓ පිළිතුර

"ඇල්මක් දක්වන පාර්ශවයන්ට තීරණගැනීම සඳහා ගිණුම්කරණ ඒකකයට අදාල ආර්ථිකමය තොරතුරු ලබාදීමේ ක්‍රියාවලිය ගිණුම්කරණයයි.

- ඉහත නිර්වචනවලට අනුව ගිණුම්කරණය තුලින් අවධාරණය කරන අනාවරණයන් දක්වන්න.

✓ පිළිතුර

- ගිණුම්කරණය ක්‍රියාවලියකි.
- ගිණුම්කරණය ක්‍රියාවලියේ නිමැවුම තොරතුරු වේ.
- එම තොරතුරු විවිධ තීරණ ගැනීම සඳහා යොදාගනී.
- තොරතුරු ඒ ඒ ව්‍යාපාර ඒකකවලට අදාලව වෙන වෙනම හඳුනාගත හැකිවේ.


අන්තර්ගතය : ඩී . එම් . එස් . දිසානායක මයා- කු / මලියදේව (පිරිමි විද්‍යාලය) ,කුරුණෑගල
යූ . බී . ධර්මදාසමයා - අ / තඹුත්තේගම විද්‍යාලය , තඹුත්තේගම
යූ . අතුල ඒකනායක මයා- මා / ශාන්ත තෝමස් විද්‍යාලය , මාතලේ.
සැකසුම :එච්.එම්.කේ.ජී.නිශාදිචන්ද්‍රමාලි රත්නායක මෙය. - පො /මින්නේරිය ජාතික පාසල , හිඟුරක්ගොඩ
Copyright © e-thaksalawa.moe.gov.lk

## 1.1.2 ගිණුම්කරණයේ අවශ්‍යතාව

◆ ගිණුම්කරණයේ අවශ්‍යතාව දක්වන්න.

✓ පිළිතුර

- ඇල්මක් දක්වන පාර්ශවයන්ට තොරතුරු ලබාදීම.
- සම්පත් පාලනය.
- සේවා නියුක්තිය ඉහල යාම.
- ආර්ථික වර්ධනය හා සංවර්ධනය.
- සමස්ත සමාජයේම ජීවන තත්ත්වය ඉහලයාම.

## 1.1.3 ආයතනයක් කෙරෙහි ඇල්මක් දක්වන පාර්ශව හා ඒ ඒ පාර්ශවයන්ගේ තොරතුරු අවශ්‍යතා.

◆ ආයතනය කෙරෙහි ඇල්මැති පාර්ශවයන් නම්කර ඔවුන්ගේ තොරතුරු අවශ්‍යතාවයන් දක්වන්න.

✓ පිළිතුර

| පාර්ශව | තොරතුරු අවශ්‍යතා |
|---|---|
| ආයෝජකයින් / ආයෝජකයන් | ▪ ආයෝජනයේ ඵලදායීතාව හා සුරක්ෂිතතාව<br>▪ තවදුරටත් ආයෝජනය කරන්නේද? |
| ණය සැපයුම්කරුවන් | ▪ සපයා ඇති ණයවල සුරක්ෂිතතාව හා<br>තවදුරටත් ණය සපයන්නේද? |
| සැපයුම්කරුවන් හා ණය හිමියන් | ▪ ණය පියවීමේ කාලය.<br>▪ ණය ආපසු ලබාගැනීමේ හැකියාව. |
| මූල්‍ය ආයතන | ▪ දෙනලද ණය අයකරගැනීම<br>▪ තවදුරටත් ණය සපයන්නේද? |
| රජය | ▪ ලැබියයුතු බදු ආදායම් අයකරගැනීම්.<br>▪ රැකියා අවස්ථා සම්පාදනය කිරීමේ හැකියාව.<br>▪ ජාතික නිෂ්පාදිතයේ වර්ධනය. |
| කළමණාකරුවන් | ▪ අරමුණු ඉටුකරගැනීමට අවශ්‍ය තීරණ ගැනීම ක්‍රියාත්මක කිරීම.<br>▪ අනාගත සැලසුම් සකස් කිරීම. |
| පාර්ශව | තොරතුරු අවශ්‍යතා |

අන්තර්ගතය : ඩී . එම් . එස් . දිසානායක මයා- කු / මලියදේව (පිරිමි විද්‍යාලය) ,කුරුණෑගල
යූ . බී . ධර්මදාසමයා - අ / තඹුත්තේගම විද්‍යාලය , තඹුත්තේගම
යූ . අතුල ඒකනායක මයා- මා / ශාන්ත තෝමස් විද්‍යාලය , මාතලේ.
සැකසුම :එච්.එම්.කේ.ජී.නිශාදි චන්ද්‍රමාලි රත්නායක මෙය. - පො /මින්නේරිය ජාතික පාසල , හිඟුරක්ගොඩ

The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

| | |
|---|---|
| විභව ආයෝජකයන් | ▪ සුදුසු ආයෝජක අවස්ථා හඳුනාගැනීම. |
| සේවකයන් | ▪ රැකියා සුරක්ෂිතතාවය.<br>▪ සාධාරණ වැටුප් ලබාගැනීම. |
| පාරිභෝගිකයන් | ▪ සපයන භාණ්ඩවල ගුණත්වය, මිල , අඛණ්ඩව ලබාගැනීමේ හැකියාව. |
| මහ ජනතාව | ▪ රැකියා අවස්ථා සමාජ සුභසාධනය. |





The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## 1.1.4 ගිණුම්කරණයේ ප්‍රභේද

◆ ගිණුම්කරණයේ ප්‍රභේද දක්වා පැහැදිලි කරන්න.

✓ පිළිතුර

- මූල්‍ය ගිණුම්කරණය.
- කළමණාකරණ ගිණුම්කරණය.

- මූල්‍ය ගිණුම්කරණය.

  යම්කිසි ගිණුම්කරණ ඒකකයක ඓතිහාසික ගනුදෙනු හා සිද්ධීන්වලට අදාල තොරතුරු ආර්ථිකමය තීරණ ගැනීමට සුදුසු ආකාරයට සකස් කර මූල්‍ය ප්‍රකාශන මගින් බාහිර පාර්ශව වෙත ඉදිරිපත් කිරීම.
- කළමණාකරණ ගිණුම්කරණය.

  යම්කිසි සංවිධානයක සියළුම කළමණාකරණ මට්ටම්වලට අදාලව සැලසුම් කිරීම, පාලනය කිරීම හා තීරණ ගැනීම යන වගකීම් ක්‍රියාත්මක කිරීමට හැකිවන අයුරින් මූල්‍ය හා මූල්‍ය නොවන තොරතුරු සැපයීම.

◆ මූල්‍ය ගිණුම්කරණය හා කළමණාකරණ ගිණුම්කරණය අතර දැකිය හැකි වෙනස්කම් පහත දැක්වෙන ශීර්ෂ යටතේ දක්වන්න.

- තොරතුරු සපයන පාර්ශව.
- තොරතුරු වාර්තා කරන කාලය.
- නෛතික ස්වභාවයන්.
- තොරතුරුවල ස්වභාවය.

✓ පිළිතුරු

| ශීර්ෂය | මූල්‍ය ගිණුම්කරණය | කළමණාකරණ ගිණුම්කරණය |
|---|---|---|
| තොරතුරු සපයන පාර්ශව. | අභ්‍යන්තර හා බාහිර | අභ්‍යන්තර කළමනාකරුවන් |
| තොරතුරු සපයන පාර්ශව. | වාර්ෂිකව | කළමනාකරණ අවශ්‍යතාවය මත |
| නෛතික ස්වභාවයන්. | නෛතික අවශ්‍යතාවයකි | නෛතික අවශ්‍යතාවයක් නොවේ |
| තොරතුරුවල ස්වභාවය. | අතීත මූල්‍යමය | අතීත, වර්තමාන, අනාගත මූල්‍යමය හා මූල්‍යමය නොවන |


Copyright © e-thaksalawa.moe.gov.lk

## 1.2.1. ගිණුම්කරණ පරිසරය හැඳින්වීම

◆ ගිණුම්කරණය යනු කුමක්ද?

✓ පිළිතුර

- ව්‍යාපාර ආයතනයක ගිණුම්කරණ ක්‍රියාවලිය කෙරෙහි බලපෑම් ඇති කරන සාධක, ගිණුම්කරණ පරිසරය වේ .

## 1.2.2. ගිණුම්කරණ පරිසර සාධක

◆ ගිණුම්කරණ පරිසර සාධක නම් කර අදාළ විචල්‍යයන් රූප සටහනක් ඇසුරින් පැහැදිලි කරන්න

✓ පිළිතුර

| පරිසරය | සාධකය |
|---|---|
| ආර්ථික හා දේශපාලන පරිසරය |  ශ්‍රී ලංකා මහ බැංකුව<br>இலங்கை மத்திய வங்கி<br>CENTRAL BANK OF SRI LANKA |
| තාක්ෂණික පරිසරය |   |



e තක්සලාව TM The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

| පරිසරය | සාධකය |
|---|---|
| ශිල්පීය හා වෘත්තීය පරිසරය | CA THE INSTITUTE OF CHARTERED ACCOUNTANTS OF SRI LANKA  |
| සමාජ හා සංස්කෘතික පරිසරය |   |
| නෛතික පරිසරය | පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය பாவனையாளர் அலுவல்கள் அதிகாரசபை CONSUMER AFFAIRS AUTHORITY ආයුබෝවන් வணக்கம் AYUBOWAN<br>දේශීය ආදායම් දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකාව உள்நாட்டு இறைவரித் திணைக்களம் - இலங்கை Inland Revenue Department - Sri Lanka |


Copyright © e-thaksalawa.moe.gov.lk

# ගිණුම්කරණ පරිසර සාධක

### තාක්ෂණික පරිසරය

- පරිගණක තාක්ෂණය
- සන්නිවේදන නව තාක්ෂණය
- නව තාක්ෂණික සොයා ගැනීම්
- ප්‍රාග්ධන ශුක්ෂ්ම ක්‍රම භාවිතා කිරීම

### ශිල්පීය හා වෘත්තීය පරිසරය

- ගිණුම්කරණ ශිල්ප ක්‍රම ක්ෂය කිරීම්
- තොග අය කිරීම්
- ගිණුම්කරණ ප්‍රමිත ගිණුම්කරණ වෘත්තීය ආයතන

### නෛතික පරිසරය

- හවුල් ව්‍යාපාර ආඥා පනත
- සමාගම් පනත
- ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනත
- දේශීය ආදායම් පනත
- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත
- ලියාපදිංචි කිරීමේ නීති
- ව්‍යාපාර ඇරඹීමේදී පරිසර අනුකූලතා භාවිතය

### සමාජ හා සංස්කෘතික පරිසරය

- සිරිත් විරිත්
- ආකල්ප
- පුරුදු
- විශ්වාස
- ජීවන රටා
- ජන සංඛ්‍යාව
- ජන සංක්‍රමණය

### ආර්ථික හා දේශපාලන පරිසරය

- බදු අයකිරීම
- විනිමය අනුපාත
- රාජ්‍යප්‍රතිපත්ති
- දේශපාලන ව්‍යුහය
- මූල්‍ය හා ප්‍රාග්ධන වෙළඳපල තත්වය
- ආර්ථික ව්‍යුහයේ වෙනස්කම්

අන්තර්ගතය : ඩී . එම් . එස් . දිසානායක මයා- කු / මලියදේව (පිරිමි විද්‍යාලය) ,කුරුණෑගල
යූ . බී . ධර්මදාසමයා - අ / තඹුත්තේගම විද්‍යාලය , තඹුත්තේගම
යූ . අතුල ඒකනායක මයා- මා / ශාන්ත තෝමස් විද්‍යාලය , මාතලේ.
සැකසුම :එච්.එම්.කේ.ජී.නිශාදිචන්ද්‍රමාලි රත්නායක මෙය. - පො /මින්නේරිය ජාතික පාසල , හිඟුරක්ගොඩ

The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## 1.2.3. ගිණුම්කරණ පරිසර සාධක වල වෙනස්වීම ගිණුම්කරණයට සිදු කරන බලපෑම

- පහත දැක්වෙන පරිසර සාධක වලට අදාළ විචල්‍යයන් මගින් ගිණුම්කරණයට ඇතිකරන බලපෑම දක්වන්න

| පරිසර සාධක | විචල්‍ය | බලපෑම |
|---|---|---|
| ආර්ථික හා දේශපාලන පරිසරය | එකතු කළ අගය මත බදු අයකිරීම | |
| නෛතික පරිසරය | 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන පනත | |
| ශිල්පීය හා වෘත්තීය පරිසරය | තොග අගය කිරීම | |
| | LKAS 01 | |
| සමාජ හා සංස්කෘතික පරිසරය | ජන සංක්‍රමණය | |
| තාක්ෂණික පරිසරය | පරිගණක තාක්ෂණය | |

✓ පිළිතුර

| පරිසර සාධක | විචල්‍ය | බලපෑම |
|---|---|---|
| ආර්ථික හා දේශපාලන පරිසරය | එකතු කළ අගය මත බදු අයකිරීම | වැට් සම්බන්ධව වෙනම ගිණුම් තැබීමක් අවශ්‍ය වීමගැනුම් මත වැට් වත්කමක් ලෙසත් විකුණුම් . මත වැට් වගකීමක් ලෙසත් ගිණුම් තැබීම |
| නෛතික පරිසරය | 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන පනත | සීමාසහිත පොදු සමාගම් ගිණුම්කරණ කටයුතු වලදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත) LKASභාවිතය ( |
| ශිල්පීය හා වෘත්තීය පරිසරය | තොග අගය කිරීම | LKAS අනුව 02 FIFO හෝ WACක්‍රම පදනම් කර ගැනීම |
| | LKAS 01 | සීමාසහත පොදු සමාගම් වල මූල්‍යප්‍රකාශන ඉදිරිපත් කළ යුතු ආකෘතිය දක්වා තිබීම |
| සමාජ හා සංස්කෘතික පරිසරය | ජන සංක්‍රමණය | ජන සංක්‍රමණය ප්‍රදේශවල ජන කණ්ඩායම් වල විවිධතා අනුව නව ව්‍යාපාර අවස්ථා බිහිවීම. පිරිවැටුම වැඩිවී ලාභය වැඩිවීම |
| තාක්ෂණික පරිසරය | පරිගණක තාක්ෂණය | ගිණුම්කරණ කටයුතු වලදී පරිගණකය පරිගණක , මෘදුකාංග භාවිතයට ගැනීම<br>උදා :MS Excel |


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## 1.2.4. ගිණුම්කරණයේ නව ප්‍රවණතා

◆ තිරසාර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීම පදනම්ව ගිණුම්කරණ ක්ෂේත්‍රෙය් දැනට භාවිතා වන නව ප්‍රවණතාවයන් කවරේද

✓ පිළිතුර

- හරිත ගිණුම්කරණය

පරිසර සංරක්ෂනය හා සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් ව්‍යාපාරය ගෙන ඇති ක්‍රියාමාර්ග හා අනුගමනය කිරීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග මූල්‍ය ප්‍රකාශන තුලින් අනාවරණය කිරීම.

- සමාජ වගකීම් ගිණුම්කරණය

ව්‍යාපාර විසින් තම අරමුණු ඉටු කර ගැනීමේදී උපයන ලාභයෙන් යම් ප්‍රමාණයක් සමාජයේ උන්නතිය උදෙසා සහ යහ පැවැත්ම උදෙසා වැය කළ යුතු බව

උදා : රෝහල් වාට්ටු ඉදිකිරීම , පිළිසකර කිරීම , වෛද්‍ය උපකරණ ලබාදීම , නොමිලේ ඇස් කණ්ණාඩි ලබා දීම

අන්තර්ගතය : ඩී . එම් . එස් . දිසානායක මයා- කු / මලියදේව (පිරිමි විද්‍යාලය) ,කුරුණෑගල
යූ . බී . ධර්මදාසමයා - අ / තඹුත්තේගම විද්‍යාලය , තඹුත්තේගම
යූ . අතුල ඒකනායක මයා- මා / ශාන්ත තෝමස් විද්‍යාලය , මාතලේ.
සැකසුම :එච්.එම්.කේ.ජී.නිශාදිචන්ද්‍රමාලි රත්නායක මෙය. - පො /මින්නේරිය ජාතික පාසල , හිඟුරක්ගොඩ

The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## 1.3.1. ගිණුම්කරණ ක්‍රියාවලිය

- ගිණුම්කරණක්‍රියාවලිය ගැලීම් සටහනක දක්වන්න

✓ පිළිතුර

| යෙදවුම් | ක්‍රියාවලිය | නිමැවුම් |
|---|---|---|
| ගණුදෙනු හා සිදුවීම් | මූලික පොත්වල සටහන් කිරීම<br>පොදු ලෙජරයට පිටපත් කිරීම<br>ශේෂ පිරික්සුම පිළියෙල කිරීම<br>මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම | මූල්‍යප්‍රකාශන<br>▪ ලාභ හෝඅලාභ ප්‍රකාශනය<br>▪ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය<br>▪ හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය<br>▪ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය<br>▪ සටහන් හා ප්‍රතිපත්ති |





Copyright © e-thaksalawa.moe.gov.lk